①

ල්කම් / சயலாளர் / ecretary
දුරකථනය / தொலைபேசி / Telephone 2449959
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2445447
E-Mail: secretary@moj.gov.lk

ධාන කාර්යාලය / பொது அலுவலகம் / General Office
දුරකථනය / தொலைபேசி / Telephone 2323022
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2320785
Web Site: www.moj.gov.lk

අධිකරණ, මානව හිමිකම් සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
நீதி, மனித உரிமைகள் மற்றும் சட்ட மறுசீரமைப்பு அமைச்சு
MINISTRY OF JUSTICE, HUMAN RIGHTS AND LEGAL REFORMS

ටෙලිග්‍රෑම් / Tele / ரெலிகிராம் — අධිකරණ ලේකම් / நீதிச்செயலாளர் / Secminjust
තැ.පෙ. / தபால்பெட்டி / P.O. Box. 555
ඉලෙක්ට්‍රොනික තැපැල / மின்அஞ்சல் / E-mail info@moj.gov.lk
උපරිමාධිකරණ සංකීර්ණය
කොළඹ 12
மீயுயர் நீதிமன்ற கட்டிடத்தொகுதி
கொழும்பு 12
Superior Courts Complex,
Colombo 12.

මගේ අංකය / எனது இல / My No. MOJ/E9/1/2016/01
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2020.06.16

JUDICIAL SERVICE COMMISSION SECRETARIAT, COLOMBO 12
29 JUN 2020

සියලුම මහාධිකරණ විනිසුරුවරුන්,
රෙජිස්ට්‍රාර් ශ්‍රේෂ්ඨාධිකරණය,
රෙජිස්ට්‍රාර් අභියාචනාධිකරණය,

2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ දීමනා සංශෝධනය කිරීම

උක්ත මැයෙන් යුත් 2019.04.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2019 හා බැඳේ.

02). රජය විසින් ප්‍රකාශිත 2019 අයවැය යෝජනා අනුව සියලුම රාජ්‍ය නිලධරයන් සඳහා 2019.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු. 2500/- ක මාසික අන්තර් දීමනාවක් ගෙවීමට කටයුතු කරන ලෙස එමගින් දන්වා ඇත.

03). තවද මා ඇමතූ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/0002(T) දරන හා 2019.09.18 දිනැති ලිපිය මගින් ද උක්ත දීමනාව විශ්‍රාම වැටුප් හිමි රාජ්‍ය නිලධරයන් සඳහා පමණක් හිමි වන බව දන්වා ඇත. (ලිපියේ පිටපතක් අමුණා ඇත).

04). ඒ අනුව ඉහත දීමනාව අධිකරණ නිලධාරීන් සඳහා ද අදාළ කරගත හැකිද යන්න පිළිබඳව විවිධ පාර්ශවයන් විසින් කළ විමසීම්වලට අනුව මේ සම්බන්ධව ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විමසූ අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2019 හි සඳහන් විධිවිධාන ආයතන සංග්‍රහයෙහි නිර්වචනය කර ඇති රාජ්‍ය නිලධාරීන්ට පමණක් හිමිවන බවත් එම නිර්වචනයට ඇතුළත් රාජ්‍ය නිලධරයා යන්නට අධිකරණ නිලධාරීන් අයත් නොවන අතර අධිකරණ සේවා කොමිෂන් සභාව යටතේ පත්වීම් ලැබූ, ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත, උපලේඛණගත නිලධාරීන්(රෙජිස්ට්‍රාර්වරුන්, පවුල් උපදේශකවරුන්, අධිකරණ ලිපිකරුවන්, පොත් බැඳුම්කරුවන්, සිතාසි බෙදන්නන්) අදාළ වන බවත් ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක EST 5/4/24(XXXV) දරන හා 2019.12.17 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත. (ලිපියේ පිටපතක් අමුණා ඇත).

05). ඒ අනුව ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ උක්ත ලිපි වල සඳහන් කරුණු ද සැලකිල්ලට ගෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2019 හි සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කරන මෙන් කාරුණිකව දන්වමි.

එස්.එම්.මොහොමඩ්
ලේකම්
අධිකරණ, මානව හිමිකම් සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

පිටපත : 1). ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව - අ.කා.ස.
2). ප්‍රධාන මූල්‍ය නිලධාරී, අධිකරණ, මානව හිමිකම් සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය